# 15. හැකියාවන් දේව ගෞරවයට

**රන්කාසි දසය’ හා ‘නැති වූ බැටළුවා’ යන උපමා තුළින් අපට ලැබෙන දේවාශීර්වාදවල වටිනාකමත් මනස්ථාපනයේ වටිනාකමත් එළිදරව් වේ. ජේසුස් වහන්සේගේ මෙම ඉගැන්වීම්වලින් නිකුත්වන දේව පණිවුඩය තේරුම් ගනිමින් එය ජීවිතයට අදාල කර ගැනීම සම්බන්ධ ව විමසා බැලීම මෙම පාඩමින් අපේක්ෂිත ය.**

## ශු. ලූක් 19:11-27, 15:1-7

ජේසුස් වහන්සේ තම ඉගැන්වීම් සඳහා යොදාගත් සරල උපමා ශෛලිය ජනතාව අතර එදා ඉමහත් ලෙස ජනප්‍රිය විය. එලෙස නැති වූ බැටළුවා හා රන්කාසි දසය පිළිබඳ උපමා කතා අද ද කිතුනුවන් ඉතා ආසාවෙන් අසන, කියවන කතා වස්තු දෙකකි.

**මින් පළමුව අපි නැති වූ බැටළුවා ගැන උපමාව විමසා බලමු.**



“බැටළුවා” යනුවෙන් හඳුන්වන්නේ කිතුනු අප ය. “එඬේරා” නම් ජේසුස් වහන්සේ ය.

බැටළුවන් වන අප එක රැළකට අයත්ව එක ස්වාමියෙක් යටතට පත් ව සිටීම දෙවි පියාණන්ගේ කැමත්ත යි. රැළේ එකට සිටින බැටළුවන්ට සාමූහික වගකීමක් ඇත. එවිට දුකක් පැමිණියත්, ප්‍රීතියක් පැමිණියත් එම ප්‍රීතියත් දුකත් එකට භුක්ති විඳිය හැකි ය. ඒ සියලු කටයුතුවල දී අපගේ රැළේ යහපත් එඬේරා සිටින හෙයින් උන්වහන්සේගේ රැකවරණයත් ශක්තියත් අපට ඇත.

නමුත් ප්‍රශ්නය ඇතිවන්නේ අපි උන්වහන්සේගේ රැළේ බැටළුවන් ලෙස ඉඳිමින් වෙන්ව හා තනි තනිව සිතන්නට යන විට දී ය. එවිට අපි තනි ගමනක් යන්නට තීරණය කරයි. එසේ යන්නේ පාපකාරී සිතුවිලි ඇතිව ය. නමුත් එසේ හිතුමතේට යන විට අප ඉක්මනින්ම අමාරුවේ වැටෙන බව නැතිවූ බැටළුවාගෙන් අපට ජේසුස් වහන්සේ පෙන්වා දෙයි.

**"ඔබ අතුරෙන් බැටළුවන් සියයක් ඇති කවර මනුෂ්‍යයෙක්,**
**උන්ගෙන් එකකු නැති වුවහොත්,**
**අනූ නව දෙනා පාළුකරයෙහි හැර දමා,**
**නැති වූ එකා පසු පස්සේ ගොස්,**
**ඌ සම්බවන තුරු සොයන්නේ නැද්ද ?**
**ඒ බැටළුවා සම්බ වූ විට ඔහු ප්‍රීති වෙමින්,**
**ඌ කර තබාගෙන ගෙදර අවුත් මිතුරන්ද අසල්වැසියන් ද කැඳවා,**
**"මා සමඟ ප්‍රීති වන්න.**
**මාගේ නැති වූ බැටලුවා සම්බ වී"යයි ඔවුන්ට කියයි.**
**ශු. ලූක් 15: 4-6**

මෙහි වැදගත්ම දේ මෙයයි. එසේ රැළෙන් වෙන්ව අකීකරුව පාපයෙන් වැටෙන බැටළුවන් සොයා ඔහු ලඟට එන ජේසුස් වහන්සේගේ ප්‍රේමයේ ගුණයයි. සමාජයේ පාපකාරී භයානක කාරණාවලට යොමුවී ඇති කවුරුන් හෝ ඉන් මුදා ගැනීම අපට ඇති අභියෝගය යි.

අපට දෙවියන් වහන්සේගෙන් ලැබී ඇති අසීමිත දේව කරුණාව ගැන සිතා අන් අයට ද ඒ කරුණාව අත්දකින්නට සැලැස්වීම අපගේ යුතුකම විය යුතුය. ඒ සඳහා දෙවියන් වහන්සේ අපට හැකියාව දෙන සේක. පාපයට වැටී සිටින එක් මිතුරකු හෝ මිතුරියක ඉන් මුදවාගන්නට අප කටයුතු කරන විට ස්වර්ගයේ මහත් ප්‍රීතිය ඇතිවන බව මෙම උපමාවෙන් අපට පෙන්වා දෙයි.

## රන් කාසි දසය පිළිබඳ උපමාව

රදළ පෙළපතෙහි වූ එක් මනුෂ්‍යයෙක් විය. ඔහු රාජ පදවිය ලබා එනු පිණිස දුර රටකට පිටත්ව යාමට පෙර ඔහු තමාගේ දාසයන් දස දෙනෙකු කැඳවීය. ඔවුන්ට රන් කාසිය බැගින් ලබාදී මා එනතුරු මෙයින් වෙලහෙලඳාම් කරන්නැයි කියා පිටත් විය.

ඔහු රාජ පදවිය ලබා පෙරලා ආ විට, තමා මුදල් දුන් දාසයන් වෙලහෙලඳාමෙහි කොපමණ උපදවා ගත්තේදැයි දැනගන්නා පිණිස ඔවුන් කැඳවීය.

| | | |
|---|---|---|
| රජතුමා | - | මා දුන් රන් කාසියෙන් ඔබ කොපමණ මුදල් උපයා ගත්තෙහි ද? |
| පළමු දාසයා | - | ස්වාමිනී ඔබේ එක් රන් කාසියෙන් රන් කාසි දසයක් උපදවා ගතිමි. |
| රජතුමා | - | ඉතා හොඳය. යහපත් වූ දාසය ඔබ ඉතා සුළු දෙයක් ගැන විශ්වාසී වූ බැවින් නගර දසයක් කෙරේ අධිපති වන්නේය. |

ඉන්පසු රජ දෙවෙනි සේවකයාගෙන් විමසන ලදී.

රජතුමා - ඔබ කොතෙක් උපදවා ගත්තෙහි ද?

දෙවන දාසයා - ස්වාමිනී ඔබ දුන් රන් කාසියෙන් රන් කාසි පහක් උපදවා ගතිමි.

රජතුමා - ඔබත් නගර පහක් කෙරෙහි අධිපති වන්නෙහිය.

මෙලෙස රජතුමා තම දාසයන් කැඳවා තමා උපයා ගත් ප්‍රමාණයන් පිළිබඳව විමසා බලා ඉතා සතුටු විය. නමුත් ඒ අතර එක් දාසයෙකුගේ පිළිතුර වූයේ

දාසයා - ස්වාමිනී, මෙන්න ඔබේ රන් කාසිය. එය රෙදි කඩක ඔතා තැබීමි. මන්ද ඔබ නොදුන් දෙය ගන්නා වූ, නොවපුළ දෙය කපන්නාවූ දැඩි සිතක් ඇති කෙනකු බැවින් ඔබට බිය වුනෙමි.

එවිට රජතුමා දැඩි ලෙස උදහස්ව කතා කරමින්

රජතුමා - නපුරු දාසය, ඔබෙ වචන වලින්ම ඔබ විනිශ්චය කරමි. මා නුදුන් දෙය ගන්නා වූ නොවපුල දේ කපන්නා වූ දැඩි සිතක් ඇති කනෙකු බව ඔබ දැන සිටියේ නම් මා ආ විට පොළියත් සමග අයකරගනු පිණිස මාගේ මුදල් තැන්පත් නො කළේ මන්ද?

රජතුමා ඉන් පසු ලඟ සිටිය තම දාසයන්ට කථා කරමින්

රජතුමා - ඒ කාසිය ඔහුගෙන් ගෙන කාසි දසය ඇත්තාට දෙන්න.

සේවකයා - ස්වාමිනී ඔහුට කාසි දසයක්ම ඇත.

රජතුමා - ඇති හැමට වැඩියෙනුත් දෙනු ලැබේ. නැති අයගෙන් ඇති දෙයත් ගනු ලැබේ.

**කියවා බලමු**
**ශු. ලූක් 19:11-27**

මෙම උපමා කථාව තුළින් ජේසුස් වහන්සේ අපට ප්‍රකාශ කලේ අපට දී ඇති හැකියාවන් වර්ධනය කර ගනිමින් දේව රාජ්‍යය උදෙසා ක්‍රියාකළ යුතු

ආකාරය වේ. එමෙන්ම තමන්ට ලැබී ඇති හැකියාවන් ක්‍රියාවට නැංවීමෙන් එම හැකියාවන් තවත් දියුණු කර ගත හැකි බව පැහැදිලි වේ. එලෙසින්ම ලැබී ඇති හැකියාවන් සඟවා තබා ගතහොත්, පවතින හැකියා පවා ගිලිහී යාමට ඉඩ ඇත.එම නිසා තම හැකියා වර්ධනය කර ගනිමින් ක්‍රියා කරන විට තව තවත් දේවාශිර්වාද ලැබෙන බැවින් ඊට අනුකූලව ක්‍රියා කිරීමට යොමු වෙමු. උන් වහන්සේ ලබා දුන් දේවාශිර්වාද තුළ ජීවත් වන අප ඒවා නිසි ලෙස පරිහරණය කරමින් එකිනෙකාගේ ජීවිත සවිමත් කිරීමට යොමු වෙමු.

### සිතා බලන්න.

ඉහත උපමා කතා දෙක අනුව දේව රාජ්‍යයේ වටිනාකම් පෙරදැරි කර ගනිමින් සදාචාරාත්මක සමාජයක් ගොඩ නැගීමට දායක වෙමු. දෙවිඳුන් වෙතින් ඈත්ව ක්‍රියා කරන්නන් පව්කරුවන් සේ ප්‍රතික්ෂේප කිරීම නොව ඔවුන් පිළිගෙන නිවැරදි කරලීමට උත්සාහ ගනිමු. ඔවුන් නැවත ස්වාමින් වහන්සේ වෙත කැඳවා ගැනීමට අප යොමු වී ක්‍රියා කරමු.

තවද එම දූත කාර්යය ඉටු කිරීමට අපට ලැබී ඇති අවස්ථා හඳුනා ගනිමින් අපගේ හැකියා ඒ සඳහා කැප කරමු. එමෙන්ම එම හැකියා නොසඟවා දේව ගෞරවය හා මහිමය උදෙසා කැප කරමින් යහපැවැත්මෙන් යුතු සමාජයක් ගොඩ නැගීමට ක්‍රියා කරමු.

### ක්‍රියාකාරකම

1. ඔබට ලැබී ඇති තලෙන්ත 5 ක් නම් කරන්න.
2. ඉරුදින පාසලෙන් ගිලිහී ගිය මිතුරු මිතුරියන් නැවත ස්වාමින් වහන්සේගේ ගෘහය වෙත කැඳවාගෙන ඒමට ඔබ ගනු ලබන පියවර 3 ක් ලියන්න.